# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 2445/33 - 2025 ජූලි මස 16 වැනි බදාදා - 2025.07.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : WLP/LAN/FLD04/ACQ/36.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :

මාතර දිස්ත්‍රික්කයේ වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජඹුරේගොඩ බටහිර ගමේ පිහිටි ක.සි. 820170 පිඹුරේ මතු සඳහන් ඉඩම ජඹුරේගොඩ බටහිර සේවා පියස ඉදිකිරීම සඳහා අත්කර ගැනීමට අවශ්‍යව ඇත.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: වැමුල්ල කුරුඳුවත්ත; වර්තමාන ඉඩම් පරිහරණය : ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම කියන අය : ජඹුරේගොඩ ගමාච්චිගේ විජයසේන, වැමුල්ලවත්ත, ජඹුරේගොඩ, වැලිගම; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0177.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2026 පෙබරවාරි මස 27 වැනි දින පෙ.ව. 10.00 ට වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2026 පෙබරවාරි මස 13 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

**ආර්. එස්. දිල්හානි නදීකා,**
ප්‍රාදේශීය ලේකම්,
වැලිපිටිය.

වැලිපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0196